# ආරක්ෂාව සුරක්ෂිත කිරීම - මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ යුරෝපා සංගම් මාර්ගෝපදේශ

## I. අරමුණ

1. මානව හිමිකම් ක්‍රියාකාරීන් සඳහා දෙන්නා වූ සහයෝගය දීර්ඝ කාලයක් පැවත ආ යුරෝපා සංගමයේ විදේශ සබඳතා ප්‍රතිපත්තියේ එක් මූලික අංගයකි. මෙම මාර්ගෝපදේශයන්හි අරමුණ නම් මෙම ගැටළු සම්බන්ධයෙන් යුරෝපා සංගමයේ ක්‍රියාකාරීත්වය පුළුල් කිරීම සඳහා ප්‍රායෝගික නිර්දේශ ලබාදීමයි. මෙම මාර්ගෝපදේශයන් තෙවන පාර්ශ්වයන් (රටවල්) සමග සබඳතාවලදී මෙන්ම බහු පාර්ශ්වික මානව හිමිකම් සංසදයන් තුලින් සියළු මට්ටම්වලදී මානව හිමිකම් ආරක්ෂාකරගැනීම සඳහා වන අයිතීන්ට ඇති ගරුත්වය ප්‍රවර්ධනය හා ධෛර්යමත් කිරීම වෙනුවෙන් යුරෝපා සංගමයේ පවත්නා ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමට හා සහාය දීමට යොදා ගත හැක. මෙම මාර්ගෝපදේශයන් අවදානම් සහිත මානව හිමිකම් ක්‍රියාකාරීන් සඳහා යුරෝපා සංගමයේ මැදිහත්වීමට විධිවිධාන සපයන අතරම, මානව හිමිකම් ක්‍රියාකාරීත්ව හා සහයෝගය ලබාදීම සඳහා ප්‍රායෝගික ක්‍රමවේද මෙහි යෝජනා කෙරේ.

මෙම මාර්ගෝපදේශයන්හි වැදගත් සංඝටකයක් වනුයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ විශේෂ කාර්ය පටිපටියක් ඇතුළු මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත හා මානව හිමිකම් ක්‍රියාකාරීන් ආරක්ෂාකිරීමට කලාපීය ක්‍රමවේදයන්ට ලබාදෙනු ලබන සහයයි. මෙම මාර්ගෝපදේශවල මග පෙන්වීම මත යුරෝපා සංගමය හා එහි සාමාජික රටවල නියෝජිතයන්ට මානව හිමිකම් ක්‍රියාකාරකයින් ආරක්ෂා කිරීමට අවශ්‍ය දැනුම ලබාදේ. මෙම මාර්ගෝපදේශයන්හි මූලික අරමුණ වනුයේ මානව හිමිකම් ක්‍රියාකාරීන්ට අදාලව විශේෂිත ගැටළුවලට මුහුණ දීම වන අතර පොදු වශයෙන් යුරෝපා සංගමයේ මානව හිමිකම් ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම සඳහා වන දායකවීම ද අපේක්ෂා කෙරේ.

## II අර්ථ නිරූපන

2. මෙම මාර්ගෝපදේශයන් සඳහා මානව හිමිකම් ආරක්ෂකයින් (ක්‍රියාකාරීන්) යන්නට නිර්වචනය

එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශයේ අරමුණ ප්‍රකාරව තනි පුද්ගලයන් කණ්ඩායම් හා සමාජ සංවිධානවල වගකීම වනුයේ ලොව පිළිගත් මානව හිමිකම් හා මූලික නිදහස ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමයි.

"සෑම කෙනෙකුටම තනිවම හෝ අන් අය හා එක්ව මානව හිමිකම් හා මූලික නිදහස සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටම්වලදී ප්‍රවර්ධනයට, ආරක්ෂාකිරීමට ප්‍රයත්න දැරීමට හා මුදුන් පත්කර ගැනීමට අයිතිය ඇත."

3. මානව හිමිකම් ක්‍රියාකාරීන් වනුයේ ගෝලීයව පිළිගත් මානව හිමිකම් හා මූලික නිදහසත් ආරක්ෂාකිරීම හා ප්‍රවර්ධනය සඳහා වන තනි පුද්ගලයින්, කණ්ඩායම් හා සමාජ සංවිධානයි. මානව හිමිකම් ක්‍රියකරීන්, සිවිල් හා දේශපාලන අයිතීන් ආරක්ෂාකිරීම හා ප්‍රවර්ධනය කිරීම මෙන්ම ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතින් ආරක්ෂාකිරීම ප්‍රවර්ධනය හා මුදුන්පත් කරගැනුමට යත්න දරයි. මානව හිමිකම් ක්‍රියාකාරීන් ආදි වාසි ප්‍රජාව වැනි කණ්ඩායම්වල සාමාජිකයන්ගේ අයිතීන් ආරක්ෂාකිරීම හා ප්‍රවර්ධනය ද සිදු කරයි. මෙම නිර්වචනයට හිංසාකාරී ක්‍රියා සිදුකරන්නන් හෝ ඒවා ප්‍රවර්ධනය කරන තනි පුද්ගලයන් හා කණ්ඩායම් හෝ අන්තර් ගත නොවේ.

**III. හඳුන්වාදීම**

4. යුරෝපා සංගමය, ගෝලීයව පිළිගත් මානව හිමිකම් හා මූලික නිදහසත් ආරක්ෂාකිරීම හා ප්‍රවර්ධනය විදහාවන තනි පුද්ගලයන්, කණ්ඩායම් හා සමාජ සංවිධානවල අයිතීන් හා වගකීම පිළිබඳ ප්‍රකාශනයේ අන්තරගත මූලධර්මයට සහයෝගය පළකරයි. මානව හිමිකම් ආරක්ෂාකිරීමේ හා ප්‍රවර්ධනය මූලික වගකීම රජයට තිබුනද, මානව හිමිකම් පුළුල් කිරීමේහිලා තනි පුද්ගලයන්, කණ්ඩායම් හා සමාජ සංවිධාන සියල්ල වැදගත් භූමිකාවන් ඉටු කරන බවට යුරෝපා සංගමය පිළිගනියි.

මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරකම් වලට පහත දෑ ඇතුලත් වේ.

- උල්ලංගනයන් වාර්තාගතකිරීම.

- එවන් උල්ලංගනයන්ට ලක්වන පුද්ගලයින් සඳහා නෛතික, මනෝ විද්‍යාත්මක වෛද්‍ය හෝ අනෙක් සහය ලබාදීම.

- නීතියේ පාලනයට නතු නොවී දිගින් දිගටම හා ක්‍රමාණුකූලව උල්ලංගනය කරන්නාවූ මානව හිමිකම් හා මූලික නිදහස වෙනුවෙන් සටන් කිරීම.

- මානව හිමිකම් සංස්කෘතිය හා මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ තොරතුරු ජාතික, කලාපීය හා ජාත්‍යන්තර මට්ටම්වලින් ප්‍රවාහය කිරීම.

5. මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ කටයුතු නිරන්තරයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියා විවේචනයට ලක්කිරීම සිදුකරයි. එනමුත් රාජ්‍යය මෙය ඍනාත්මක දෘෂ්ටියෙන් දැකිය යුතු නොවේ. රාජ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙල නිදහස් සංවාදයකට ඉඩ සලසාදීම මූලධර්මානුකූල වන අතර මානව හිමිකම් ආරක්ෂාකිරීම සඳහා වඩා හොඳ තලයක් බිහිකිරීම සඳහා මෙය සාර්ථක ක්‍රමවේදයකි. මානව හිමිකම් ප්‍රවර්ධනයට හා ආරක්ෂාකරගැනීම සඳහා මානව හිමිකම් ක්‍රියාකාරීන්ට රජයට සහාය වියහැක. ව්‍යවස්ථා කෙටුම්පත්කිරීම සඳහා වන සාකච්ඡාමය ක්‍රියාවලියේ කොටසක් වීමෙන් හා මානව හිමිකම් පිළිබඳ ජාතික සැළසුම් හා මූලෝපායන් සම්පාදනයේදී වැදගත් භූමිකාවක් ඔවුන්ට ඉටු කළ හැකිය. මෙම භූමිකාව පිළිගත යුතු අතරම සහාය දීම ද කළ යුතුවේ.

6. මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ක්‍රියාකාරකම් පසුගිය අවුරුදු පුරාවට වඩ වඩාත් පිළිගැනීමට ලක්ව ඇති බව යුරෝපා සංගමය පිළිගනියි. ඔවුහු වැඩිවැඩියෙන් හිංසාවන්ට ලක්වූවන්ට වැඩි ආරක්ෂාවක් සහතික කිරීම සඳහා පෙනී සිටියි. මේ ප්‍රගතිය අත්කර ගත්තේ විශාල කැපකිරීමක් තුළිනි. බොහෝ රටවල මානව හිමිකම් ක්‍රියාකාරීන් පහරදීමේ ඉලක්ක බවට පත්ව ඔවුන්ගේ මූලික අයිතීන් උල්ලංඝනය වී ඇත. මානව හිමිකම් ක්‍රියාකාරීන් ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම හා ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම වැදගත් බව යුරෝපා සංගමය විශ්වාසය කරයි. මේ සඳහා සලකා බැලීමේ දී ස්ත්‍රී - පුරුෂ දෘෂ්ටි කෝණය යොදා ගනිමින් මානව හිමිකම් ක්‍රියාකාරීන් සම්බන්ධයෙන් ප්‍රවේශ වීම වැදගත් වේ.

**III. ක්‍රියාකාරීත්ව මාර්ගෝපදේශයන්**

7. මෙම මාර්ගෝපදේශවල ක්‍රියාකාරී අංශයක් වන්නේ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ ප්‍රගතිය ආරක්ෂාව සඳහා වූ ක්‍රියාවන් හා ක්‍රමවේද පොදු විදේශ හා ආරක්ෂා ප්‍රතිපත්ති රාමුව තුල හඳුනාගැනීමයි.

**නිරීක්ෂණය, වාර්තාකරණය හා ඇගැයීම**

8. තමන් අනුයුක්ත රටෙහි මානව හිමිකම් වාතාවරණය පිළිබඳ නිරන්තර වාර්තා සැපයීමට දැනටමත් යුරෝපා සංගම් නියෝජිතයන් හා ප්‍රධානින්ට උපදෙස් දී ඇත. මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී පාර්ශ්ව මෙම කාර්යය මුදුන්පත්කර ගැනීමට අවශ්‍ය දත්ත පත්‍රිකා අනුමත කොට ඇත. මෙම දත්ත පත්‍රිකාවට මානව හිමිකම් ක්‍රියාකාරීත්වය පිළිබඳ වාතාවරණය හා විශේෂයෙන් මානව හිමිකම් ක්‍රියාකාරීන් ට මරණීය තර්ජන හා පහරදීම් ඇත්නම් ඒවා පිළිබඳ විස්තරාත්මක වාර්තා සැපයිය යුතුයි. මෙකී සන්දර්භය තුල තමන්ගේ කාර්ය භාරයෙන් ආරක්ෂාකාරීව ඉටුකිරීමට මානව හිමිකම් ක්‍රියාකාරීන් හට විශාල බලයක් පිටුවහලක් ලබාදීමට මෙම ආයතනික රාමුවට හැකි බව නියෝජිතයන් හා ප්‍රධානීන් දත යුතුයි.

ව්‍යවස්ථාමය, අධිකරණමය, පරිපාලනමය හා අනෙක් ක්‍රියාමාර්ග තුළින් රජය විසින් කිසියම් හෝ හිංසාවකින්, තර්ජනයකින්, පළිගැනීමකින් නෛතික හෝ නෛතික නොවන අගතිගාමී වෙනස් කොට සැලසීමෙන් පීඩනය හෝ වෙනත් යම් අත්තනෝමතික ක්‍රියාමාර්ගවලට මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශිත අයිතීන් නෛතිකව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයන්ට ලක්වීමෙන් පුද්ගලයන් ආරක්ෂාකරගැනීම වැනි සියල්ල මෙයට අදාල වේ.

9. යුරෝපා සංගමයේ හා එහි සාමාජික රටවල තානාපතිවරුන්ට මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ තත්වය දේශීය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් වලදී සාකච්ඡාකර නිසි ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දී ඇත. අවශ්‍ය තන්හි (HOMS) ආයතන ප්‍රධානීන් විසින් සුදුසු යුරෝපා සංගම් පියවරයන් සඳහා නිර්දේශ ප්‍රධාන කාර්යාලයට (COHOM) ඉදිරිපත් කළ යුතුය. මානව හිමිකම් ක්‍රියාකාරීන්ට තර්ජන හා පහරදීම් ඇති වූ විට මෙම ක්‍රියා හෙළා දකිමින් නිවේදන නිකුත් කිරීම කළ යුතුය. ඔවුන්ගේ ජීවිත තර්ජන හා බරපතල අවධානයට ලක්ව ඇති අවස්ථාවක මානව හිමිකම් ක්‍රියාකාරීන්ට සහයෝගය පළ කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ආයතන ප්‍රධානීන්ට තීරණ ගැනීමේ හැකියාව ඇත. එම ක්‍රියාමාර්ග පසු ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සහිතව ප්‍රධාන ආයතනයට (COHOM) වාර්තා කළ යුතුය. (HOMS) ප්‍රධානීන් යුරෝපා සංගමයේ ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්තා මේ සමග ඉදිරිපත් කළ යුතුය. කාන්තා මානව හිමිකම් ක්‍රියාකාරීන් මුහුණ දෙනු ලබන අවදානම් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

10. යුරෝපය හා එහි සාමාජික රටවල තානාපතිවරුන්ගේ (HOMS)වාර්තා හා අදාළ අනෙකුත් තොරතුරු සමග එක්සත් ජාතීන්ගේ නියෝජිතයන්ගේ වාර්තා හා යුරෝපා සංගමයේ මිනිස් අයිතිවාසිකම් සඳහා වූ කොමසාරිස් ද ඇතුළුව අනිකුත් රාජ්‍ය නොවන සංවිධාන නිර්දේශ (COHOM) ආයතනයට ලබා දීමෙන් අවශ්‍ය තත්ත්වයන් හඳුනාගැනීමත් අවශ්‍ය ක්‍රියාමාර්ගයන් නිර්දේශ කිරීමත් සිදුවේ.

**මානව හිමිකම් ක්‍රියාකාරීන් ආරක්ෂාකිරීම හා ඔවුන්ට අවශ්‍ය සහාය ලබාදීමට යුරෝපා සංගම් නියෝජිතායතනයන්හි කාර්‍යභාරය**

11. බොහෝ තුන්වන පාර්ශ්වයේ රටවල යුරෝපා සංගම් නියෝජිතායතන හා සාමාජික රටවල තානාපති කාර්යාල හා සාමාජික රටවල් හා බිම් මට්ටමේ මානව හිමිකම් ක්‍රියාකාරීන් අතර මූලික අන්තර් මුහුණත වේ. මෙමගින් යුරෝපා සංගමයේ මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඔවුන්ට පැවරී තිබේ. එමෙන්ම ඔවුහු සමහර අවස්ථාවල යුරෝපා සංගම් ක්‍රියාමාර්ග නිසා මානව හිමිකම් ක්‍රියාකරුවන්ට මරණ තර්ජන හා පහරදීම් වලට මග පෑදිය හැකි බව දත යුතුයි. එබැවින් ඔවුන් සුදුසු තන්හි අපේක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳ මානව හිමිකම් ක්‍රියාකාරීන් සමග සාකච්ඡා කළ යුතු අතර. යුරෝපා සංගමය සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබුවේ නම් සංගම් නියෝජිතායතන විසින් මානව හිමිකම් ක්‍රියාකාරීන්ට හා ඔවුන්ගේ පවුල්වලට ඒ පිළිබඳව දැනුවත් කළ යුතුවේ.

යුරෝපා සංගම් නියෝජිතායතන විසින් ගත හැකි ක්‍රියාමාර්ගයන්ට පහත කරුණු ඇතුළත් වේ. මෙම මාර්ග උපදේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා ස්වකීය මූලයයන් සැපයීම. කාන්තා මානව හිමිකම් ක්‍රියාකාරිත්ව පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුයි. මෙම මාර්ගෝපායයන් සිවිල් සංස්කෘතික ආර්ථික දේශපාලනික හෝ සමාජීය අයිතීන් ආරක්ෂාකිරීම හා ප්‍රවර්ධනය සිදුකරන මානව හිමිකම් ක්‍රියාකාරිත්වය ආවරණය කරන බව යුරෝපා සංගම් නියෝජිතායතන මතක තබා ගත යුතුය. නියෝජිතායතන ස්වකීය දේශීය සැපයීම හා ඒවා නිරීක්ෂණයෙහි ලා වාර්තාකරණයේදී මානව හිමිකම් ක්‍රියාකාරීන් හා ඔවුන්ගේ සංවිධාන හවුල්කර ගත යුතුයි.

මානව හිමිකම් ක්‍රියාකාරීන් හා තානාපතිවරුන්ට දේශීය මානව හිමිකම් තත්ත්වය යන කෙෂත්‍රයන්හි යුරෝපා සංගම් ප්‍රතිපත්තිය හා මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ යුරෝපා සංගම් මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීමට දේශීය මුලෝපායන් යොදා ගැනීම වැනි මාතෘකා පිළිබඳ සාකච්ඡා කිරීමට වසරකට වරක්වත් රැස්වීම සංවිධානය සිදු කළ යුතුයි.

සමීප සබඳතා මගින් හා තොරතුරු හුවමාරුව තුළින් අවධානමට ලක්වූවන් ඇතුළු සියලූ මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ තොරතුරු බෙදාගැනීම

- මානව හිමිකම් ක්‍රියාකාරීන් සමග නිරන්තර සබඳතා ඇති කර ගැනීම ඔවුන් කටයුතු කරන ප්‍රදේශ චාරිකා සංවිධානය කිරීම සම්බන්ධතා නිලධාරීන් පත් කර ගැනීම හා අවශ්‍ය අවස්ථාවන් හිදී ඔවුන් සමග වැඩ බෙදාගෙන කටයුතු කිරීම.

- අවශ්‍ය හා සුදුසු තන්හි, මානව හිමිකම් ක්‍රියාකාරීන් හා ඔවුන්ගේ කාර්යභාරයන් සඳහා දෘශ්‍යමාන පිළිගැනීම ලබාදීම. මේ සඳහා අන්තර් ජාලය හා නව තොරතුරු හා සන්නිවේදන තකෂණයත් ඇතුළු මාධ්‍ය යොදාගැනීමෙන් ප්‍රචාරණය. ඔවුන් ලබාගෙන ඇති ත්‍යාග ලබාගැනීම සඳහා ආරාධනය කිරීම හා බැහැදැකීම් සිදුකිරීම.

- සුදුසු තන්හි, අත්අඩංගුවේ හෝ නිවාස අඩස්සියේ පසුවන මානව හිමිකම් ක්‍රියාකාරීන් බැහැදැකීම හා ඔවුන්ගේ නඩු විභාගයන් සඳහා නිරීක්ෂකයන් ලෙස සහභාගිවීම.

**තුන්වන පාර්ශයයේ රටවල් හා බහුපාර්ශ්වීය සංසදයන් තුළ මානව හිමිකම් ක්‍රියාකරණයන් සඳහා ගරුත්වය ප්‍රවර්ධනය**

12. යුරෝපා සංගමයේ අරමුණ වනුයේ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ අයිතීන්ට ගරුකිරීමත් තම බැඳීම් ඉටුකිරීමට තුන්වන පාර්ශ්වයේ රටවල් වෙත බලපෑම් කිරීම හා රාජ්‍ය නොවන පාර්ශ්වයන්ගෙන් සිදුවන ප්‍රහාර හා තර්ජනවලින් ඔවුන් ආරක්ෂාකිරීමයි. තෙවන පාර්ශ්ව රටවල් හා සමග සම්බන්ධතාවලදී යුරෝපා සංගමය අවශ්‍ය තන්හි සියලූ රටවල් විසින් අදාල ජාත්‍යන්තර සම්මතයන් හා ප්‍රමිතීන් අනුගමනය කිරීමත් අනුගතවීමත් අවධාරණය කෙරේ. (විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය) සමස්ථ අරමුණ විය යුත්තේ මානව හිමිකම් ක්‍රියාකාරීන්ට නිදහසේ ක්‍රියාකල හැකි පරිසරයක් නිර්මානය කිරීමයි. යුරෝපා සංගමය තම අරමුණු මානව හිමිකම් ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍ය අංගයක් ලෙස හුවා දැක්වීමටත් මානව හිමිකම් ක්‍රියාකාරීන් ආරක්ෂාකිරීම සඳහා දක්වන වැදගත්කම අවධාරණයත් සිදු කෙරේ. මෙම අරමුණු සඳහා සහාය දැක්වීමේ ක්‍රියාමාර්ගයන්ට පහත දෑ ඇතුලත් වනු ඇත.

- පොදු විදේශ හා ආරක්ෂක ප්‍රතිපත්ති සඳහා වන සභාපතිගේ නියෝජිත හෝ මානව හිමිකම් සඳහා වන මහලේකම් හෝ පෞද්ගලික නියෝජිතගේ යුරෝපා සංගමයේ විශේෂ නියෝජිතවරුන් හා ප්‍රදානීන් යුරෝපා සංගමය හෝ එම රටවල නියෝජිතයින් තුන්වන පාර්ශ්වයේ රටවල සංචාරය කරන විට සුදුසු තන්හි මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ කාර්යන් නිසා හටගන්නා ගැටළු හා තනි පුද්ගල වාතාවරණයන් සාකච්ඡා කෙරෙන මානව හිමිකම් ක්‍රියාකාරීන් සමග කෙරෙන රැස්වීම් මෙම සංචාරයන්හි අත්‍යවශ්‍ය කොටසක් ලෙස ඇතුලත් කළ යුතුයි.

- යුරෝපා සංගමය හා තුන්වන පාර්ශ්වයේ රටවල් හා කලාපීය සංවිධාන අතර පැවැත්වෙන දේශපාලන සංවාදයන් මානව හිමිකම් සංඝටකයට අදාල තැන්හි මානව හිමිකම් ක්‍රියාකාරීන් වාතාවරණය ඇතුළත් විය යුතුයි මානව හිමිකම් ක්‍රියාකාරීන් හා ඔවුන්ගේ කාර්‍යයන් සඳහා වන සහයෝගය යුරෝපා සංගමයේ අවධාරණය කර සිටින අතර අවශ්‍ය තන්හි තනි පුද්ගලයන්ගේ විෂයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ඇත. යුරෝපා සංගමය මානව හිමිකම් ක්‍රියාකාරීන් ඉතාමත් සුදුසු ක්‍රමවේදයන් තුළ මානව හිමිකම් සංවාද පිළිබඳ යුරෝපා සංගම් මාර්ගෝපදේශයන්ට අනුකූලව සංවාදයන් සඳහා සූදානම්වීම, පසු විපරම් හා ඇගැයීම් සඳහා ඇතුළත් කරගැනීමට සුපරීක්ෂාකාරී වනු ඇත.

යුරෝපා සංගම් නියෝජිතායතන හා තානාපති කාර්යාල තුන්වන පාර්ශ්වයේ රටවල්හි බලධාරීන්ට අනතුරකට ලක්වූ හෝ ලක්විය හැකි මානව හිමිකම් ක්‍රියාකාරීත්වය ආරක්ෂාකිරීමට කාර්‍යක්ෂම ක්‍රියාමාර්ග දියත්කිරීමේ වගකීම මතක් කර දෙනු ඇත.

- සහෘදාත්මක රටවල් සමග විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ මහා සභාව හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සභාව තුල කිට්ටුවෙන් කටයුතු කිරීම.

- සුදුසු තැන්හි, මානව හිමිකම් සභාවේ කාලීන විශ්ව සමාලෝචනයට යටත් වන රටවලට නව ව්‍යවස්ථා හා පරිචිතයන් එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයට අනුකූලතාව යුතු බවට නිර්දේශ කිරීම.

## මානව හිමිකම් ක්‍රියාකාරීන් ආරක්ෂා කිරීමට

මානව හිමිකම් ක්‍රියාකාරීන් සඳහා වන නාභි ලක්ෂය, යුරෝපීය ආරක්ෂාව හා සහයෝගිතාවය සඳහා වන සංවිධානයේ ප්‍රජාතාන්ත්‍රික ආයතන හා මානව හිමිකම් වැනි ජාතික මානව හිමිකම් ආයතන, යුරෝපා සභාවේ මානව හිමිකම් පිළිබඳ කොමසාරිස්, අප්‍රිකානු මානව හා ජනතා හිමිකම් කොමිසමේ මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ විශේෂ නියෝජිත හා මානව හිමිකම් පිළිබඳ අන්තර් - ඇමරිකානු කොමිසමේ විශේෂ මානව හිමිකම් ක්‍රියාකාරී ඒකකය වැනි මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ ආරක්ෂාව සඳහා පවත්නා කලාපීය ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම ප්‍රවර්ධනය හා එවැන්නක් නොමැති කලාපයන්හි සුදුසු ක්‍රමවේදයන් නිර්මාණය කිරීම.

## මානව හිමිකම් ක්‍රියාකාරීන් සඳහා වන විශේෂ නියෝජිත ඇතුළු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සභාවේ විශේෂ කාර්ය පටිපාටියන් සඳහා සහයෝගය

13. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් සභාවේ විශේෂ කාර්‍ය පටිපාටියන් (හා ඒවා ක්‍රියාත්මක කරන විශේෂ නියෝජිතයන්, විශේෂ වාර්තාකරුවන්, ස්වාධීන විශේෂඥයන් හා ක්‍රියාකාරී කමිටු) තම ස්වාධීනත්වය හා නොනැඹුරුතාවය, ලොව පුරා මානව හිමිකම් ක්‍රියාකාරීන්ට එරෙහි හිංසාවන්ට විරුද්ධව හඬනැගීමටත් ක්‍රියාකිරීමටත්, රටවල සංචාරය කිරීමටත් හැකිවීම හේතුකොටගෙන මානව හිමිකම් ක්‍රියාකාරීන් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යාන්තර ප්‍රයත්නයන්හිදී අත්‍යාවශ්‍ය වන බවට යුරෝපා සංගමට පිළිගනියි. මේ සඳහා මානව හිමිකම් ක්‍රියාකාරීන් සඳහා වන විශේෂ වාර්තාකරුට කාර්යභාරයක් තිබෙන අතර, අනෙක් විශේෂ කාර්ය පටිපාටියන්ට ඇති කාර්යභාරයන්ද මානව හිමිකම් ක්‍රියාකාරීන්ට අදාලවේ. විශේෂ කාර්ය පටිපාටියන් සඳහා යුරෝපා සංගමයේ සහයෝගයන්ට පහත දෑ ඇතුලත්විය යුතුයි.

- එක්සත් ජාතීන්ගේ විශේෂ කාර්ය පටිපාටියක් යටතේ දේශ සංචාරය සඳහා කරන ඉල්ලීම්, ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගැනීමට රජයන් දිරිමත් කිරීම.

- යුරොපා සංගම් නියෝජිතායතන හරහා දේශීය මානව හිමිකම් ප්‍රජාවන් හා මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින් එක්සත් ජාතීන්ගේ තේමා ක්‍රමවේදයන් පරිශීලනය හා මානව හිමිකම්

ක්‍රියාකාරීන් තේමා ක්‍රමවේදයන් අතර සම්බන්ධතා ගොඩනැගීම හා තොරතුරු හුවමාරුව ප්‍රවර්ධනය ඇතුලත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- නිසි සම්පත් නොමැතිව විශේෂ කාර්ය පටිපාටියන් සඳහා ඇති කාර්යභාරයට ක්‍රියාත්මක කල නොහැකි බැවින්, යුරෝපා සංගම් සාමාජික රටවල් විසින් පොදු අයවැයෙන් අවශ්‍ය තරම් අරමුදල්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්‍යාලය වෙත සපයයි.

**සංවර්ධන ප්‍රතිපත්තිය තුලින් මානව හිමිකම් ක්‍රියාකාරීන් වෙත ප්‍රායෝගික සහය**

14. යුරෝපා සංගමය හා සාමාජික රටවල් මඟින් සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාදාමයන් හා ආයතනයන්, සංවර්ධනය හා මානව හිමිකම් සුරැකීමට හා ප්‍රවර්ධනය අරමුණුකොට ඇති - ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් පිළිබඳ යුරෝපා සාධන පත්‍රය වැනි වැඩසටහන් මානව හිමිකම් ක්‍රියාකාරීන්ට සහයෝගී වීමට සාමාජික පුළුල් පරාසයකින් යුතු ප්‍රායෝගික සහයන් අතරට ඇතුලත් වේ. මේවාට සාමාජික රටවල සංවර්ධන සහයෝගිතා වැඩසටහන් ඇතුලත්වන නමුත් අත්‍යවශයෙන්ම ඒවාට සීමා නොවේ. ප්‍රායෝගික සහයයන්ට පහත දෑ ඇතුලත්විය හැක.

- කුසලතා ගොඩනැගීම හා ප්‍රජා දැනුවත් කරන වැඩසටහන්, රාජ්‍ය නොවන සංවිධාන, මානව හිමිකම් ක්‍රියාකාරීන් හා ජාතික මානව හිමිකම් ආයතන අතර සහයෝගීතාවය ප්‍රවර්ධනය වැනි ක්‍රියාකාරකම් තුලින් මානව හිමිකම් ක්‍රියාකාරීන් මෙන්ම මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරකම් සුරකින හා ප්‍රවර්ධනය කරන රාජ්‍ය නොවන සංවිධාන වලට සහය දීම.

- පැරිස් මූලධර්මයට අනුකූලව පිහිටවූ ජාතික මානව හිමිකම් ආයතනය ඔම්බුඩ්ස්මන් කාර්යාල හා මානව හිමිකම් කොමිෂන් සභා වැනි මානව හිමිකම් සුරකින හා ප්‍රවර්ධනය කරන ජාතික ආයතනයන් පිහිටුවීමට හා ඔවුන්ගේ කාර්‍යභාරය දිරිගැන්වීමට සහාය වීම

- මානව හිමිකම් ක්‍රියාකාරීන් සඳහා යුරෝපා සංගමය තුලත් ඉන් පිටතත් රැස්වීම සඳහා පහසුකම් සැපයීම ඇතුළු මානව හිමිකම් ක්‍රියාකාරීන් සඳහා ජාත්‍යාන්තර මට්ටමින් ජාලයක් පිහිටුවීමට සහය වීම.

- තුන්වෙනි පාර්ශවයේ රටවල්වල මානව හිමිකම් ක්‍රියාකාරීන්ට මූල්‍ය සම්පත් ඇතුළු සම්පත් විදේශයන්ගෙන් ලබාගැනීමට හා එවන් සම්පත් පිළිබඳ දැනුවත්ව සිටීමට හා ඒවාට ඉල්ලුම් කිරීමට ඇති ප්‍රවේශය සුරක්ෂිත කිරීම.

- මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයට ඇතුළු දෑ ප්‍රවර්ධනයට හා මානව හිමිකම් පිළිබඳ දැනුවත්කරන වැඩසටහන් අනිවාර්‍යයෙන් ලබාදීම.

- තුන්වන පාර්ශවයේ රටවල අනතුරටලක්ව සිටින මානව හිමිකම් ක්‍රියාකාරීන්ට සුදුසු තැන්හි හදිසි වීසා ලබාදීම හා යුරෝපා සංගම් සාමාජික රටවල තාවකාලික නවාතැන් සඳහා පහසුකම් සැපයීම වැනි ක්‍රියා මඟින් සහය හා ආරක්ෂාව ලබා දීමට ක්‍රියාමාර්ග සැපයීම.

**ක්‍රියාකාරී පාර්ශව සභාවේ භූමිකාව**

15 තම කාර්යභාරයට අනුකූලව COHOM, මානව හිමිකම් ක්‍රියාකාරීන් පිළිබඳ මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම සමාලෝචනය සම්බන්ධීකරණය හා අනෙක් අදාල ක්‍රියාකාරී පාර්ශ්ව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. ඒවාට පහත දෑ ඇතුලත් වේ.

- අදාල යුරෝපා සංගම් ප්‍රතිපත්ති හා ක්‍රියා සමඟ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ ගැටළු ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම.
- මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සුදුසු කාලයන් තුලදී සමාලෝචනය කිරීම.
- සුදුසු ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අනෙක් ජාත්‍යන්තර හා කලාපීය සම්මන්ත්‍රණයන් සමඟ මානව හිමිකම් ක්‍රියාකාරීන්ට සහයවීම සඳහා වැඩිදුර සහයෝගීතාවයන් ඇති ක්‍රියාමාර්ග පිළිබඳව විභාග කිරීම.
- දේශපාලන හා ආරක්ෂාව පිළිබඳ කමිටුව  හා නිත්‍ය නියෝජිතයන්ගේ කමිටුව හරහා වාර්ෂිකව සුදුසු තැන්හි මෙම මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය සභාවට වාර්තා කිරීම.

**ඇඳුම 1**

**මහ සභාව**

- ලොව සියළු රටවල් තුල සියළු පුද්ගලයන් සඳහා සියළු මානව හිමිකම් හා මූලික නිදහස සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අන්තර්ගත අරමුණු හා ප්‍රතිපත්ති රැකීමේ වැදගත්කම යලි අවධාරණය කරමින්ද,

- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, මානව හිමිකම් හා මූලික නිදහස රැකීම හා ඒවාට ගරුකිරීමේ ප්‍රවර්ධනය සඳහා වන ජාත්‍යන්තර ප්‍රයත්නයන්ගේ මූලිකාංග ලෙසත් එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුල සම්මත මෙන්ම කලාපීය මට්ටමේ අනෙක් මානව හිමිකම් සාධන පත්‍රයන්ගේ වැදගත්කම යලි අවධාරණය කරමින්ද,

- ජාත්‍යන්තර ප්‍රජාවගේ සියළු සාමාජිකයන් එක්ව හෝ තනි තනිව, ජාතිය, ආගම, වර්ණය, ලිංගභේදය, භාෂාව, දේශපාලනික අනෙක් අදහස් මත, ජාතික හෝ සමාජ සංගමය, දේපල, උපත හෝ අනෙක් තත්වයන් මත පාදිත වෙනස්කොට සැලකීම , ඇතුළු කිසිදු භේදයකින් තොරව මානය හිමිකම් හා මූල්‍ය නිදහස සඳහා ගරුත්වය ප්‍රවර්ධනයට හා දිරිගැන්වීමට ඇති ගාම්භීර පූර්වක වගකීම සම්පූර්ණ කිරීම හා මෙම වගකීම ප්‍රඥප්තියට අනුකූලව ඉටුකිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය අත්කර ගැනීමේ  සුවිශේෂී වැදගත්කම යලි අවධාරණය කරමින්ද,

- චේතනාන්විතව, විවෘතව හා සංවිධානශීලීව වර්ණභේද වාදය, සියළු ආකාරයේ වර්ණ භේදය, යටත්විජිත වාදය, විදේශ ආධිපත්‍යයේ පාලනය, ආක්‍රමණශීලීත්වය හෝ හිංසනය ජාතික ස්වෛරීත්වයට, ජාතික සමගියට හෝ භෞමික අඛණ්ඩතාවයට වන තර්ජන හා ජනතාවගේ ස්වයං-තීරණයට ඇති අයිතිය හා තම වස්තුව හා ස්වභාවික සම්පත් භුක්ති විඳීමට තිබෙන පූර්ණ පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීමෙන්ද හටගන්නා ජනතාවගේ හා පුද්ගලයන්ගේ මානව හිමිකම් හා මූලික නිදහස සම්බන්ධ සියළු උල්ලංඝනයන් කාර්‍යක්ෂමව තුරන් කිරීම සඳහා පුද්ගලයන්,කණ්ඩායම් හා සංගම් විසින් සිදුකරන ලද වටිනා දායකවීම් හා ඒ සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය දරණ වැදගත් භූමිකාව පිළිගනිමින් ද,

- ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව අතර සහ මානව හිමිකම් හා මූලික නිදහස භුක්තිවිඳීම අතර සම්බන්ධතාවය පිළිගනිමින් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව නොමැතිවීම අනුකූල නොවීම නිදහසට කරුණක් නොවන බව ස්මරණය කරමින්ද,

- සියළු මානව හිමිකම් හා මූලික නිදහසත්, විශ්ව නොබෙදිය හැකි, අන්තර් - සම්බන්ධතා හා අන්තර් - යැපුම් සහිත බවත් සාධාරණ හා යුක්තිසහගත ලෙසත් එම නිදහස සහ අයිතීන් එකිනෙක ක්‍රියාත්මක කිරීමට අගතියක් නොවන ලෙසත් ප්‍රවර්ධනය හා ක්‍රියාත්මක කළ යුතු බවට පුනරුක්ති කරමින්ද,

- මූලික නිදහස හා මානව හිමිකම් ප්‍රවර්ධනය හා සුරැකීමේ ප්‍රමුඛ වගකීම හා යුතුකම රජයට පැවරී තිබෙන බව

- මානව හිමිකම් හා මූලික නිදහස පිළිබඳ දැනුම හා ගරුත්වය ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් ප්‍රවර්ධනය කිරීමට පුද්ගලයන්ට, කණ්ඩායම් වලට හා සමාජයන්ට ඇති අයිතිය හා වගකීම පිළිගනිමින්ද,

මෙසේ ප්‍රකාශකොට සිටියි:

1 ව්‍යවස්ථාව

සෑම පුද්ගලයෙකුටම අන් අය හා එක්ව හෝ තනි තනිව, මානව හිමිකම් හා මූලික නිදහස ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් ප්‍රවර්ධනයට හා සුරැකීමට අයිතිය ඇත.

2 ව්‍යවස්ථාව

1 සෑම රජයකටම සියළු මානව හිමිකම් හා මූලික නිදහස ආරක්ෂා කිරීමට, ප්‍රවර්ධනයට හා ක්‍රියාත්මක කිරීමට, සමාජීය, ආර්ථික, දේශපාලනික හා අනෙක් ක්ෂේත්‍රයන් තුලත් නෛතික සහතික කිරීම් ඇතුළු අවශ්‍ය සියළු තත්වයන් ඇතිකිරීමෙහිලා අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත්, තම රාජ්‍ය බලය යටතේ සිටින සියළු පුද්ගලයින්ට, තනි තනිව හෝ අන් අය හා එක්ව මෙම නිදහස හා හිමිකම් ප්‍රායෝගිකව භුක්තිවිඳීම සහතික කරලීම ප්‍රමුඛ වගකීම හා යුතුකම පැවරී ඇත.

2 සෑම රජයක්ම, වත්මන් ප්‍රකාශණයේ ප්‍රකාශිත සියළු හිමිකම් හා නිදහස් සුරැකුම කාර්‍යක්ෂමව සහතික කිරීමෙහිලා අවශ්‍ය යැයි හැඟෙන සියළු ව්‍යවස්ථාදායි පරිපාලනමය හා අනෙක් පියවරක් ගතයුතුය.

3 ව්‍යවස්ථාව

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය හා රජයක් යටත් අනෙකුත් ජාත්‍යන්තර බැඳීම් හා අනුකූල දේශීය ව්‍යවස්ථා, මානව හිමිකම් හා මූලික නිදහස ක්ෂේත්‍රයන් තුල නෛතික රාමුව සළසන අතර, එතුල මානව හිමිකම් හා මූලික නිදහස ක්‍රියාත්මක කිරීම, භුක්ති විඳීම හා එම අයිතීන් හා නිදහස් ප්‍රවර්ධනය, සුරැකීම හා කාර්‍යක්ෂමව මල්එල ගැන්වීමට වත්මන් ප්‍රකාශනයේ ප්‍රකාශිත සියළු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුයි.

4 ව්‍යස්ථාව

වත්මන් ප්‍රකාශණයේ ඇති කිසිවක් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අරමුණු හා ප්‍රතිපත්ති වලට පටහැනි හෝ බාදාකාරී ලෙස අර්ථ නිරූපනය නොකළයුතු අතර මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ හා මානව හිමිකම් පිළිබඳ ජාත්‍යාන්තර සම්මුති හා මෙම ක්ෂේත්‍රයන්ම අදාල අනෙක් ජාත්‍යාන්තර සාධන පත්‍රයන්හි විධිවිධාන හා බැඳීම් සීමාකරන හෝ බලහීන කරන ලෙස නොගත යුතුයි.

5 ව්‍යවස්ථාව

සෑම පුද්ගලයෙකුටම මානව හිමිකම් හා මූලික නිදහස ප්‍රවර්ධනය හා සුරැකීමේ අරමුණු සඳහා තනි තනිව හෝ අන් අය හා එක්ව ජාතික හෝ ජාත්‍යාන්තර මට්ටම් වලඃ

අ) සාමකාමීව රැස්වීමට හෝ හමුවීමට
ආ) රාජ්‍ය නොවන සංවිධාන, සමිති හෝ කණ්ඩායම් පිහිටුවීම්, ඒවාට බැඳීම හා හෝ සහභාගී වීමට
ඇ) රාජ්‍ය නොවන හා අන්තර් රාජ්‍ය සංවිධාන සමඟ සන්නිවේදනය කිරීමේ අයිතිය ඇත.

6 ව්‍යවස්ථාව

සෑම පුද්ගලයෙකුටම තනි තනිව හෝ අන් අය හා එක්ව,

අ) සියළු මානව හිමිකම් හා මූලික නිදහස දේශීය ව්‍යවස්ථාදායී, අධිකරණ හෝ පරිපාලන පද්ධති තුල බලාත්මක අන්දම පිළිබඳ තොරතුරු වලට ප්‍රවේශය ඇතුළු තොරතුරු දැනගැනීමට, සෙවීමට, ලබාගැනීමට, පිළිගැනීමට හා තබාගැනීමට

ආ) මානව හිමිකම් හා අනෙක් බලාත්මක ජාත්‍යන්තර සාධන පත්‍රයන්හි විධිවිධාන ප්‍රකාරව මානව හිමිකම් හා මූලික නිදහස පිළිබඳව අන් අය වෙත අදහස්, තොරතුරු හා දැනුම ලබාදීමට හෝ බෙදාහැරීමට, නිදහසේ ප්‍රකාශනයට

ඇ) සියළු මානව හිමිකම් හා මූලික නිදහස නීතියෙන්ද ප්‍රායෝගිකවද ක්‍රියාත්මක වීම පිළිබඳ අධ්‍යයනයට, සාකච්ඡාවට, අදහස් ඇතිකර ගැනීමට හා දැරීමටත් මෙම හා අනෙක් සුදුසු ක්‍රියාමාර්ග තුලින් මහජන අවධානය මේ සඳහා යොමු කිරීමටත් අයිතිය ඇත .

7 ව්‍යවස්ථාව

සෑම පුද්ගලයෙකුටම තනි තනිව හෝ අන් අය හා එක්ව නව මානව හිමිකම් සංකල්පය හා මූලධර්ම සාකච්ඡා කිරීමටත් සංවර්ධනයකිරීමට හා ඒවා පිළිගැනීමට අයිතිය ඇත.

8 ව්‍යවස්ථාව

1 සෑම පුද්ගලයෙකුට තනි තනිව හෝ අන් අය හා එක්ව වෙනස් නොකොට සළකන පදනමක් මත තම රටෙහි රජයෙහි පොදු කටයුතු වලට සහභාගී වීමට කාර්‍යක්ෂම ප්‍රවේශය ලැබීමට අයිතිය ඇත.

2 මෙයට හා අන් ඒවා අතර, තනි තනිව හෝ අන් අය හා එක්ව, රාජ්‍ය ආයතන, නියෝජිතායතන හා පොදු කටයුතු පිළිබඳ සංවිධාන වලට ඒවාහි ක්‍රියාකාරිත්වය

වැඩිදියුණු කිරීමට විවේචන හා යෝජනා ඉදිරිපත් කිරීමටත් මානව හිමිකම් හා මූලික නිදහස ප්‍රවර්ධනයට, සුරැකීමට හා මුදුන්පත් කර ගැනීමට ඒවාහි ක්‍රියාකාරිත්වය බාධාකාරී හෝ සීමාකාරී වේනම් එය පිළිබඳ අවධානය යොමු කිරීමටත් අයිතිය ඇත.

9 ව්‍යවස්ථාව

1 වත්මන් ප්‍රකාශනයේ දැක්වෙන මානව හිමිකම් හා මූලික නිදහස සුරැකීම හා ප්‍රවර්ධනය ඇතුළු මානව හිමිකම් හා මූලික නිදහස ක්‍රියාත්මක කිරීමේදී, සෑම පුද්ගලයෙකුටම, තනි තනිව හෝ අන් අය හා එක්ව මෙම අයිතීන් උල්ලංඝනයෙන් ආරක්ෂා වීමට හා කාර්‍යක්ෂම ප්‍රතිකර්මයන් භුක්ති විඳීමට අයිතිය ඇත.

2 මෙම අරමුණු සඳහා තමන්ගේ අයිතීන් උල්ලංඝනය කරන ලදැයි කියන සෑම පුද්ගලයෙකුටම, තමන් විසින්ම හෝ නෛතිකව පත්කළ නියෝජිතයෙකු මගින් පැමිනිලි කිරීමටත් එම පැමිනිල්ල ස්වාධීන, අපක්ෂපාතී හා නිසි බලය ඇති අධිකරණ හෝ නීතිය මගින් පිහිටුවූ වෙනත් බලධාරියෙකු ඉදිරියේ පවත්වනු ලබන මහජන විභාගයකදී විභාග කරනු ලැබීමටත්, එවන් ආයතනයකින් මානව හිමිකම් හා මූලික නිදහස උල්ලංඝනයක් සිදුවී ඇත්නම් වන්දි ගෙවීම ඇතුළු ප්‍රතිකර්ම සලසන්නාවූ නීත්‍යානුකූල තීන්දුවක් ලබාගැනීමටත් අවසානාත්මක තීන්දුව හා ප්‍රදානයට අනිසි ප්‍රමාදයකින් තොරව ලබාගැනීමටත් අයිතිය ඇත.

3 එම අරමුණු උදෙසාම සෑම පුද්ගලයෙකුටම තනි තනිව හෝ අන් අය හා එක්ව, අනෙක්වා අතරඃ

අ) මානව හිමිකම් හා මූලික නිදහස උල්ලංඝනය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන හා තනි නිලධාරීන්ගේ ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිබඳව, පෙත්සම් මගින් සහ අනෙක් සුදුසු මාර්ගයන්ගෙන් නිසි බලය ඇති දේශීය අධිකරණ, පරිපාලන හෝ ව්‍යවස්ථාදායී ආයතනයන්ට හෝ රජයේ නීති පද්ධති මගින් විධිවිධාන සලසා ඇති වෙනත් ඕනෑම නිසි බලධාරියෙකුට පැමිනිලි කිරීමටත්, තම පැමිනිලි සම්බන්ධයෙන් අනිසි ප්‍රමාදයකින් තොරව තීරනයක් ලබාගැනීමටත්

ආ) මහජන විභාගයක්, නඩු විභාගයක් හෝ නඩුකාරයන්ට සහභාගී විය හැකි බලාත්මක ජාත්‍යන්තර බැඳීම් හා වගකීම් හා ජාතික නීතියන් තුල ඒවායේ අනුකූලතාවය පිළිබඳව අදහස් ඇතිකර ගැනීමටත්

ඇ) මානව හිමිකම් හා මූලික නිදහස ආරක්ෂා කරගැනීමට සහය හා සුදුසුකම් ලත් වෘත්තීමය නීති සහය හා අනෙක් අදාල උපදේශ ලබාදීමට හා සැපයීමටත් අයිතිය ඇත.

4 එම අරමුණු සඳහාම බලාත්මක ජාත්‍යන්තර සාධන පත්‍රයන් හා කාර්‍ය පටිපාටියන්ට අනුකූලව සෑම පුද්ගලයෙකුටම, තනි තනිව හෝ අන් අය හා එක්ව, මානව හිමිකම් හා මූලික නිදහස ගැටළු සම්බන්ධයෙන් සන්නිවේදනයක් ලබාගැනීමට පොදු හෝ විශේෂ නිසි බලය ඇති ජාත්‍යන්තර ආයතනයක් වෙත හා ඒවා සමග සන්නිවේදනය කිරීමට නිර්බාධිත ප්‍රවේශයට හා ඒවා මගින් එම ගැටළු සලකනු ලැබීමටත් අයිතිය ඇත.

5 සෑම රජයක්ම තම බල ප්‍රදේශය තුල මානව හිමිකම් හා මූලික නිදහස උල්ලංඝනයක් සිදුවූ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු සාධක ඇති විට ඉක්මන් හා අපක්ෂපාතී විමර්ශනයන් හා පරීක්ෂණ පැවැත්වීස සිදුකිරීම හා සහතික කරලීම සිදුකළ යුතුය.

10 ව්‍යවස්ථාව

කිසිම පුද්ගලයෙකු ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින්, මානව හිමිකම් හා මූලික නිදහස උල්ලංඝනයට සහභාගී නොවිය යුතු අතර එසේ ප්‍රතික්ෂේප කිරීම මත දණ්ඩනයකට හෝ කිසිදු ආකාරයක අගතිගාමී ක්‍රියාවකට යටත්කරනු නොලැබිය යුතුයි.

11 ව්‍යවස්ථාව

සෑම පුද්ගලයෙකුටම, තනි තනිව හෝ අන් අය හා එක්ව තම රැකියාවක හෝ වෘත්තියක නීත්‍යානුකූලව නිරත වීමට අයිතිය ඇත. තම රැකියාව හෝ වෘත්තිය නිසාම අන් අයගේ අභිමානය, මානව හිමිකම් හා මූලික නිදහසට බලපෑමක් සිදුකරන සෑම පුද්ගලයෙකුටම එම අයිතීන් හා නිදහස ගරුකළයුතු අතර රැකියාවට අදාල ජාතික හා ජාත්‍යාන්තර ප්‍රමිතීන් හා වෘත්තීය සුසිරිත් හා ආචාර ධර්මයන්ට අනුකූල විය යුතුයි.

12 ව්‍යවස්ථාව

1. සෑම පුද්ගලයෙකුටම තනිතනිව හෝ අන් අය හා එක්ව මානව හිමිකම් උල්ලංගනය කිරීම්වලට එරෙහිව සාමකාමී ක්‍රියාකාරකම්වවල සහභාගිවීමට අයිතිය ඇත.

2. රජය විසින් සෑම පුද්ගලයකුම, තනිතනිව හෝ අන් අය හා එක්ව හිංසාවකින් තර්ජනයකින් පළිගැනීමකින් නෛතික හෝ නෛතික නොවන අගතිගාමී වෙනස්කොට සැලකීම්, පීඩයනයන්ගෙන් හෝ වෙනත් ඕනෑම අත්තනෝමතික ක්‍රියවවලට තත්වය ප්‍රකාශනයේ දැක්වෙන අයිතීන් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙන යටත්වීමෙන් වළකනු ලැබීම සුරක්ෂිත කරලීම සඳහා බලය ඇති නිසි ආයතන මාර්ගයෙන් සියලු සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ.

3. මේ හා සම්බන්ධව සෑම පුද්ගලයකුම තනිතනිව හා අන් අය හා එක්ව රජයට අදාළවිය හැකි මනා වූ උල්ලංගනය කරන ක්‍රියා, ක්‍රියාකාරකම් හා නොකරහැරීම් ඇතුළුව මහමු භුක්තිවීමට බාධා පමුනුවන්නාවූ පුද්ගලයන් හෝ කණ්ඩායම් මහත් සේ සිදුකරන හිංසාවන්ට එරෙහිව සාමකාමීව එරෙහිවීමේදී හා ප්‍රතික්‍රියා දැක්වීමේදී ජාතික නීතියන්ට අනුකූලව කාර්යක්ෂමව සුරුකනු ලැබීමට හැකියාව ඇත්තේය.

13 ව්‍යවස්ථාව

සෑම පුද්ගලයෙකුටම තනි තනිව හො අන් අය හා එක්ව වත්මන් ප්‍රකාශනයේ 3 ව්‍යවස්ථාව ප්‍රකාරව) මත වූ සාමකාමී ලෙස ප්‍රවර්ධනය හා සුරැකුම් ප්‍රකාශිත අරමුණ සඳහා සම්යක් ඉල්ලාසිටීමටත් පිළිගැනීමට හා උපයෝගීකරකරගැනීමටත් අයිතිය ඇත.

14 ව්‍යවස්ථාව

1. රජයට තම බල ප්‍රදේශය තුළ සියලු පුද්ගලයන්ට තම සිවිල් දේශපාලනික ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතීන් අවබෝධකරගැනීමට ප්‍රවර්ධනය සඳහා ව්‍යවස්ථායී අධිකරණ පරිපලනයේ අනෙක් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට වගකීව ඇත.

2. එවන් ක්‍රියාමාර්ගවලට අනෙක්වා අතර ජාතික ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාශනයටත් ඒවා පතලකිරීමටත්.

මානව හිමිකම් ක්ෂේත්‍රයේ රජය විසින් පාර්ශ්වකරුවකු වන ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතියට අනුකූලව පිහිට වූ ආයතනයන්ට රජය විසින් සලසනු ලබන වාරික මෙන්ම

සාකච්ඡා වල සාරාංශ වාර්තා මෙම ආයතනවල නිල වාරිකය ඇතුළු ජාත්‍යන්තර ලේඛනවලට සම්පූර්ණ හා සමාගක ප්‍රවේශයක් ලැබීමත් අඩංගු විය යුතුයි

3. රජයක් සුදුසු තන්හි තම බල ප්‍රදේශය තුළ ප්‍රවර්ධනයට හා සුරුකීමටත් ඔම්බුඩ්ස්ටන්,මානව හිමිකම් කොමිසන් සභා හෝ අනෙක් ඕනෑම ජාතික ආයතනයක් මගින් හෝ වුවද තවදුරටත් සවාධික ජාතික ආයතන ගොඩනැගීමේ හා වර්ධනය සහතිකකරලීම හා සහාය දීම සිදු කළ යුතුයි.

## 15 ව්‍යවස්ථාව

රජයකට මානව හිමිකම් ක්‍රියාකාරීන් සියලු අධ්‍යයන මට්ටම්තුල ඉගැන්වීමටත් ප්‍රවර්ධනයටත් නීතිඥවරුන් නීතය ක්‍රියාත්මක කරන නිලධාරීන් සන්නද්ධ හමුදාවල සාමාජිකයින් හා රජයේ සේවකයන් පුහුණු කිරීමේ වගකීම ලත් සියල්ලන් විසින් සුදුසු මානව හිමිකම් මූලධර්මයන් ඇතුලත්කිරීම සහතික කරලීමටත් වගකීම පැවරේ.

## 16 ව්‍යවස්ථාව

පුද්ගලයන්ට, රාජ්‍ය නොවන සංවිධානයන්ට හා අදාල ආයතනයන්ට සියළු මානව හිමිකම් හා මූලික නිදහස සම්බන්ධ ගැටළු පිළිබඳව ඉගැන්වීම, පුහුණු කිරීම හා මේ අංගහන් තුල පර්යේෂණ වැනි ක්‍රියාකාරකම් තුළින් මහජනතාව දැනුවත් කිරීමට දායකවීමේ වැදගත් භූමිකාවක් දරන අතර එමගින් අනෙක්වා අතර (සියළු ජාතීන් හා සියළු ජනවාර්ගික හා ආගමික කොටස් අතර) අවබෝධය, ඉවසීම සමග මිත්‍ර සම්බන්ධතා එම ක්‍රියාකාරකම් සිදුකරන සමාජයන් හා ප්‍රජාවන්ගේ පසුබිම සිතින් තබාගනිමින් තවදුරටත් ගොඩනැගිය හැකිය.

## 17 ව්‍යවස්ථාව

වත්මන් ප්‍රකාශනයේ දැක්වෙන මානව හිමිකම් හා මූලික නිදහස ක්‍රියාත්මක කිරීමේදී තනිතනිව හා අන් අය හා එක්ව ක්‍රියාකරන සෑම පුද්ගලයෙකුම බලාත්මක ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල සීමාකිරීම්වලට පමණක් යටත්කරනු ලැබිය යුතු අතර ඒවා හුදෙක් අන් අයගේ මානව හිමිකම් හා මූලික නිදහස සඳහා නිසි පිළිගැනීම හා ගරුත්වය සහතික කරලීම පිණිෂ යන අරමුණු සඳහා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සදාචාරය, නීතිහ හා සාමය හා පොදු සුභ සාධනය පිණිස යුක්තිගරුක අවශ්‍යතා සෑහීම සඳහා පමණක් නීතියෙන් නිර්නය කළ හැකියි.

## 18 ව්‍යවස්ථාව

1. සෑම පුද්ගලයෙකුටම ප්‍රජාව වෙත හා එකල වගකීම් පවතින අතර තම පෞරුෂත්වයේ නිදහස් හා පරිපූර්ණ සංවර්ධනයක් ඇතිවන්නේ ඉන් පමණි.

2. පුද්ගලයන්ට, කණ්ඩායම්වලට, ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාකිරීමට මානව හිමිකම් හා මූලික නිදහස ප්‍රවර්ධනයට හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ආයතන හා ක්‍රියාදාමයන් ප්‍රවර්ධනයට දායකවීමේ වගකීම හා වැදගත් භූමිකාවක් දරයි.

3. පුද්ගලයන්, කණ්ඩායම් හා රාජ්‍ය නොවන සංවිධානවලට සුදුසු තන්හි සෑම කෙනෙකුටම මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා අනෙක් මානව හිමිකම් සාධන පත්‍රයන්හි දැක්වෙන මානව හිමිකම් හා මූලික නිදහස පූර්ණ වශයෙන් මුදුන් පත්කරගත හැකි සමාජීය හා ජාත්‍යන්තර විධි පිළිවෙලකට ඇති අවකාශ ප්‍රවර්ධනය කිරීමෙහිලා දායකවීමෙහි වගකීම හා වැදගත් භූමිකාවක් දරයි.

19 ව්‍යවස්ථාව

වත්මන් ප්‍රකාශනයෙහි ඇති කිසිවක් කිසිදු පුද්ගලයකු, කණ්ඩායමක් හෝ සමාජ අවයවයක් හෝ රජයක් විසින් වත්මන් ප්‍රකාශනය දක්වා ඇති මානව හිමිකම් හා මූලික නිදහස ඛණ්ඩනය අරමුණු කොටගත් කිසිදු ක්‍රියාකාරකමක නියැලීමට හෝ කියපු ක්‍රියාමාර්ගයන් කිරීමට අයිතියක් හඟවන ලෙස අර්ථ නිරූපනය නොකළ යුතුයි.

20 ව්‍යවස්ථාව

වත්මන් ප්‍රකාශනයේ ඇති කිසිවක්, රජයකට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ විධිවාධානවලට එරෙහිව ක්‍රියාකරන පුද්ගලයන්, කණ්ඩායම්, ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරකම් ප්‍රවර්ධනයට හා ඒවාට සහායවීමට අවසර දෙන ලෙස අර්ථ නිරූපනය නොකළ යුතුයි.

ඇඳුමට ඇමුනුම

අදාළ ජාත්‍යන්තර සාධන පත්‍ර

- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

- සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

- වධ හිංසාවලින්, කෘෘර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ල හෝ දඬුවමට එරෙහි සම්මුතිය

- ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

- කාන්තාවන්ට වෙනස්කොට සැලකීම තුරන් කිරීමේ සම්මුතිය

- සියළු ආකාරයේ වාර්ගික භේදනය

- මානව හිමිකම් පිළිබඳ යුරෝපා සම්මුතිය, එහි මූලපත්‍රයන් හා යුරෝපා මානව හිමිකම් අධිකරණයේ අදාල නඩු තීරණ නීතිය

- මානව හා ජනතාවගේ අයිතීන් පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය

- මානව හිමිකම් පිළිබඳ ඇමෙරිකානු සම්මුතිය

- යුරෝපීය සමාජ ප්‍රඥප්තිය (සංශෝධිත)

- යුද වින්දිතයන්ගේ ආරක්ෂාව පිළිබඳ ජිනීවා සම්මුතිය හා එහි මූලාශ්‍රයන් මෙන්ම සන්නද්ධ අරගලවලට බලපාන සම්ප්‍රදායික රීති.

- 1951 සරණාගතයන්ගේ තත්ත්වය පිළිබඳ සම්මුතිය හා එහි 1967 මූලපත්‍රය

- ජාත්‍යන්තර අපරාධ අධිකරණය පිළිබඳ රෝම ප්‍රඥප්තිය

- ගෝලීයව පිළිගත් මානව හිමිකම් හා මූලික නිදහස ප්‍රවර්ධනය හා සුරැකීමෙහිලා පුද්ගලයන්ගේ, කණ්ඩායම් හා සමාජ අවයවයන්ගේ අයිතිය හා වගකීම පිළිබඳ ප්‍රකාශනය